# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2048/39 - 2017 දෙසැම්බර් මස 07 වැනි බ්‍රහස්පතින්දා - 2017.12.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

විධාන අංක 63

**2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත**

12(2) වගන්තිය යටතේ විධානය

2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 12(2) වගන්තිය මගින් පැවරී ඇති බලතල ප්‍රකාර, ක්‍රියාත්මක වෝල්ටීයතාවය වෝල්ට් 250ට නොවැඩි පහත සඳහන් අයිතම/නිෂ්පාදන, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය මගින් නිකුත් කරනු ලබන ප්‍රමිති සහතික ලාංඡනය දරන්නේ නම් මිස, නිෂ්පාදනය කිරීම, ආනයනය කිරීම, බෙදාහැරීම, ගබඩා කිරීම හෝ තොග වශයෙන් හෝ සිල්ලර වශයෙන් විකිණීම හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම, විකිණීම සඳහා ඉදිරිපත් කිරීම නොකළ යුතු බවට සියළු නිෂ්පාදකයින්, ආනයනකරුවන්, බෙදාහරින්නන් සහ වෙළෙන්දන් වෙත, පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් මෙයින් විධාන කරනු ලැබේ.

| | *නිපැයුම/අයිතම* | *ශ්‍රී ලංකා ප්‍රමිතිය* SLS |
|---|---|---|
| (i) | කම්බි මාරු කළ හැකි හා කම්බි මාරු කළ නොහැකි පේනු | SLS 734 : Part 1 |
| (ii) | ස්විච සහිත හෝ ස්විච රහිත කෙවෙනි පිටවාන්, විදුලි දිගු සහ අතේ ගෙන යා හැකි කෙවෙනි පිටවාන් | SLS 734 : Part 2 |
| (iii) | ඇඩැප්ටර සහ තනි පරිවර්තක ඇඩැප්ටර | SLS 734 : Part 3 |
| (iv) | විලායක සහිත සම්බන්ධීකාරක ඒකක (ස්විච සහිත සහ ස්විච රහිත) | SLS 734 : Part 4 |
| (v) | විලායක සහිත පරිවර්තක පේනු | SLS 734 : Part 5 |
| (vi) | පේනු සහ කෙවෙනි පිටවාන් සවිකර ඇති කේබල් රීල් | SLS 1532 |

මෙම විධානය වර්ෂ 2019 ජනවාරි මස 01 වැනි ද සිට බල පැවැත්වෙනු ඇත.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අණ පරිදි,

හසිත තිලකරත්න,
සභාපති.

2017 දෙසැම්බර් මස 07 වැනි දින,
කොළඹ දී ය.

12- 755/1

විධාන අංක 64

**2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත**

12(2) වගන්තිය යටතේ විධානය

2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 12(2) වගන්තිය මගින් පැවරී ඇති බලතල ප්‍රකාර, ක්‍රියාත්මක වෝල්ටීයතාවය වෝල්ට් 250ට නොවැඩි කිසියම් විදුලි උපකරණයක් SLS 734 : 1 වන කොටස සඳහන් ප්‍රමිතියට අනුකූල වන විදුලි පේනුවක් දරන්නේ නම් මිස, නිෂ්පාදනය කිරීම, ආනයනය කිරීම, බෙදාහැරීම, ගබඩා කිරීම හෝ තොග වශයෙන් හෝ සිල්ලර වශයෙන් විකිණීම හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම, විකිණීම සඳහා ඉදිරිපත් කිරීම නොකළ යුතු බවට සියළු නිෂ්පාදකයින්, ආනයනකරුවන්, බෙදාහරින්නන් සහ වෙළෙන්දන් වෙත පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් මෙයින් විධාන කරනු ලැබේ.

මෙම විධානය වර්ෂ 2019 ජනවාරි මස 01 වැනි ද සිට බල පැවැත්වෙනු ඇත.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අණ පරිදි,

හසිත තිලකරත්න,
සභාපති.

2017 දෙසැම්බර් මස 07 වැනි දින,
කොළඹ දී ය.

12- 755/2